# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/31 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2017/101.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1)වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන් :*

ඩී. වසන්ත ජයසිංහ මයා. අංක 368/7, පයිප්ප පාර, කොස්වත්ත, තලංගම උතුර, බත්තරමුල්ල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2017/101.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන් :*

ඩී. වසන්ත ජයසිංහ මයා, අංක 368/7, පයිප්ප පාර, කොස්වත්ත, තලංගම උතුර, බත්තරමුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාළු පාර, රත්මලාන.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

‘‘ඩී. වසන්ත ජයසිංහ මහතාව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කොන්ත්‍රාත් සේවකයකු ලෙස රාජකාරි ඉටුකිරීමට පත්කර, ඔහුගෙන් ස්ථිර සේවකයන් ඉටුකරන රාජකාරි ලබා ගත්ත ද, ස්ථිර සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ලබා නොදීම තුළින් අසාධාරණයක් සිදුව තිබේද? එසේ සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද?’’ යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 579

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.